&× ´ {ÆæÈ à`Ñí ó
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

**5 ශ්‍රේණිය** **සිංහල** **කාලය පැය 1 යි. වි. 30 යි.**

නම/ විභාග අංකයඃ

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01 පහත වූ ඡේදය කියවා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

මුදු මොළොක් නිල් තණින් ගැවසුනු උයන ඉතා සුන්දරය. නිල් තණ අතර තැනින් තැන පිපී තිබුණු සිත්කලු මල් තරු මෙන් බබළයි. මලින් ගැවසුනු පිච්ච ගස් සොළසක් වැවී තිබුණි. වසන්ත කාලයේ ලා රත් පැහැයෙන් යුතු සියුමැලි විසිතුරු වූ ගස්වල අතුපතර ලැග සිටි කුරුල්ලන් කෙතරම් මිහිරි නදින් ගී ගැයුවෝ ද කියතොත් ළමයි කෙළි සෙල්ලම් නතර කොට ඔවුන්ගේ ගී වලට ඇහුම්කන් දීමට පුරුදුව සිටියෝය. මෙසේ අප සෙල්ලම් කරන්නේ කොතරම් සන්තෝෂයෙන්දැයි එකිනෙකාට පවසා ගත්හ.

(1) මෙම ඡේදයෙන් කියවෙන්නේ කුමක්ද ?

..............................................................................................

(2) ''සිත්කලු'' යන්නට සමානාර්ථය දෙන පදයක් ලියන්න.

..............................................................................................

(3) මිහිරි යන්නට විරුද්ධාර්ථය දෙන පදයක් ලියන්න.

..............................................................................................

(4) ''ගැයුවෝද'' යන පදය කුමන කාලයට අයත්ද?

..............................................................................................

(5) විකසිත වී තිබුණා යන්නෙහි තේරුම ලියන්න.

..............................................................................................

(6) මෙහි කියවෙන යුගල පදයක් ලියන්න.

..............................................................................................

(7) මෙහි කියවෙන උපමාවක් ලියන්න.

..............................................................................................

(8) මලින් ගැවසුණු පිච්ච ගස් කීයක් තිබුණාද?

..............................................................................................

(9) ළමයි ඇහුම්කන් දුන්නේ කාටද?

..............................................................................................

(10) මල් බබළන්නේ කුමක් වගේද?

..............................................................................................

(2 x 10 = 20)

02 ගැළපෙන සේ යා කරන්න.

| | | | |
|---|---|---|---|
| (1) | කටවහර | (i) | හිලව්වට ගොවිතැන් කටයුතු වලට සහභාගි වීම |
| (2) | ගින්දර | (ii) | මුහුදේ ප්‍රචණ්ඩව රළ නැගෙන කාලය |
| (3) | වාරකන් | (iii) | සේදූ මැණික් සහිත කොටස |
| (4) | අත්තම | (iv) | රත්නා |
| (5) | නාම්බුව | (v) | කතා කරන භාෂාව |

(1 x 5 = 05)

03 හිස් තැනට යෙදෙන නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය යටින් ඉරක් අඳින්න.

(1) කර්මාන්ත ශාලාවේ ...................... මේ වසරේ දියුණු වී ඇත.

1. නිෂ්පාදනය 2. නිස්පාදනය 3. නිශ්පාදනය

(2) වෙද මහතා රෝගියාට ................................ නියම කළේය.

1. අවුසද 2. ඖෂධ 3. ඖෂධ

(3) අනුරාධපුරය ................................. නගරයකි.

1. ඓතිහාසික 2. අයිතිහාසික 3. එයිතිහාසික

(4) අපි දුරුතු පෝයදාට ............................... විහාරය වැඳීමට ගියෙමු.

1. කැළණි 2. කැලනි 3. කැලණි

(5) කොළඹ ....................................... තල්මසාගේ ඇට සැකිල්ලක් දක්නට ලැබේ.

1. කෞතුකාගාරයේ 2. කවුතුකාගාරයේ

3. කව්තුකාගාරයේ

(1 x 5 = 05)

04 උත්තර ලියන්න.

(1) තනි වචන ලියන්න.

1. කුඹුරක ලියද්දකින් වතුර බසින තැන ..................................

2. ගඟ මුහුදට වැටෙන ස්ථානය ..................................

(2) වචන ගළපා අර්ථවත් වැකියක් සාදන්න.

1. විට / කන්ද / නගින / ශ්‍රී පාද / දිස්වේ / අවටින් / වනය

..................................................................................

2. නිවසකම / සෑම / ලැබුණි / වෙසක් / දක්නට / සැරසිලි

..................................................................................

(3) දී ඇති වාක්‍ය වලට විරාම ලකුණු යොදන්න.

1. අයියෝ අම්මා හරි සීතලයි

2. ළමයෝ ළමයෝ මොකද උඹ අඬන්නේ

(4) පහත වාක්‍යවලට ගැලපෙන අතීතකාල ආඛ්‍යාත පද ලියන්න.

1. අපි පෙත් කියවා අවසන් ..............................

2. ගොවියෝ කුඹුර ..............................

(5) පහත විස්තරාත්මක පදවලට අදාළ කෙටි යෙදුම ලියන්න.

1. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

..............................

2. සමුපකාර තොග වෙළඳ සංස්ථාව

..............................

(6) යුගල පද ලියන්න.

1. ඉඩම් - .............................. 2. ඔප්පු - ..............................

(7) දී ඇති අදහස අනුව සුදුසු ප්‍රස්තා පිරුළු ලියන්න.

1. කරදරයකට පත් වූ කෙනෙක් ඊට වඩා කරදරයකට පත්වීම

..............................

2. අනතුරුදායක ක්‍රියාවක් වෙනත් අය ලවා කරවා ගැනීම

..............................

(8) සුදුසු ආඛ්‍යාත පද ලියන්න.

1. අම්මත්, මමත්, නංගීත් නගරයට ..............................

2. සිටු දියණිය මාලිගාවට ..............................

(9) පහත සඳහන් ගද්‍ය, පද්‍ය කොටස් උපුටාගත් ග්‍රන්ථ ලියන්න.

1. ගම්ං ඇවිල්ලා, ගම්ං ඇවිල්ලා

..............................

2. මල් ලස්සනයි හොඳ හොඳ පාටයි කීවා

..............................

(10) තේරවිලි විසඳන්න.

1. ටක් ගානව ටික් ගානව - ටිකක් කනව දොර වහනව

..............................

2. උඩිනුත් ගින්දර - යටිනුත් ගින්දර

මැද සවුදර - කන්නෙ පාන්දර ..............................

(2 x 20 = 40)

05 පහත සඳහන් ආරාධනා පත්‍රය කියවා අසන ලද ප්‍රශ්නවලට උත්තර ලියන්න.

සුහද ඇරයුමයි !

වටගම ප්‍රාථමික විද්‍යාලයේ 5 ශ්‍රේණියේ දරු දැරියන් ඉදිරිපත් කරනු ලබන ''සිසු නිර්මාණ'' ප්‍රදර්ශනය 2015. 08. 15 දින පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේ දී පැවැත්වේ. එය නැරඹීමට ඔබ සැමට ආරාධනා.

මෙයට,

5 ශ්‍රේණියේ දූ දරුවන්.

2015. 08. 10

(1) මෙය කුමක් සඳහා කළ ආරාධනා පත්‍රයක් ද? ..............................

(2) ආරාධනා කර ඇති දිනය හා ආරම්භ වන වේලාව ලියන්න.

..............................

(3) උත්සවය පැය කීයක් පැවැත්වෙනවා ද? ..............................

(4) ආරාධනා කළ ස්ථානය කුමක් ද? ..............................

(5) ආරාධනා කරන්නේ කවුරුන්ද? ..............................

(2 x 5 = 10)

06 දී ඇති වචන අතරින් හිස් තැනට වඩාත් සුදුසු වචනය ලියන්න.

(1) දවස පුරාම ඇදහැලෙන .......................... වැස්සේ තෙමී තෙත බරිත වී තාත්තා ගෙදර පැමිණියේ බොහෝ ප්‍රමාද වෙමින්ය. (හිරිපොද / නාකපන)

(2) කුරුලු ................................................ කුල්මත් වී සොබා සුන්දරත්වය විඳිමින් සිටිද්දී කුසගින්න ද ඔහුට අමතක විය. (ගර්ජනාවෙන් / කූජනයෙන්)

(3) ගමේ පන්සලේ ප්‍රධාන දායක තැන .......................... වීමෙන් නායක හාමුදුරුවෝ බොහෝ කණගාටුවට පත්වූහ. (අපවත් / අභාවප්‍රාප්ත)

(4) කණයාට කිරි ........................................ කියාදුන්නා වගේ (රස / සුදු)

(5) පන්ති කාමර කොරිඩෝව දිගේ විදුහල්පතිතුමා එනු දුටු ළමෝ එකවර .......................................... (නිහඬ / දිව ගියේය) වූහ.

(2 x 5 = 10)

07 දී ඇති මාතෘකාවට අනුව වචන 4 කට නොවැඩි උක්ත ආඛ්‍යාත සම්බන්ධය ඇති අර්ථවත් වැකි 5 ක් ලියන්න.

**අපි අවුරුද්දට ගමේ ගිය දා**

(1) ..............................................................................

(2) ..............................................................................

(3) ..............................................................................

(4) ..............................................................................

(5) ..............................................................................

(ල. 10)